3 වන පිටෙන්

ව්‍යාපාර කළමණාකරන ක්ෂේත්‍රයේ උදාහරණයක්ම ගෙන මෙය විස්තර කළ හැකිය.

යම්කිසි ව්‍යාපාරිකයෙකුගේ ව්‍යාපාරයක් ලාභ නොලබා බංකොලොත් භාවය කරා ගමන් කරමින් සිටින්නේ යයි සිතමු. එම ව්‍යාපාරිකයා හට තම අර්බුදය සඳහා චතුරාර්ය සත්‍ය ඉගැන්වීම ආදේශ කර තමන් මුහුණ දී ඇති අර්බුදය මැනැවින් විශ්ලේෂනය කර ගැනීමටත් ඉන් ගොඩ ඒමටත් හැකියාව ලැබේ. චතුරාර්ය සත්‍යයේ ප්‍රධාන පදනම් 4 කි. දුක, දුකට හේතුව, දුක නැති කිරීම සහ දුක නැති කිරීමේ මාර්ගය යනුවෙනි. ඒ අනුව තත් ව්‍යාපාරිකයා, බංකොලොත්භාවය, බංකොලොත්භාවයට හේතුව, බංකොලොත්භාවයෙන් මිදීම සහ ඉන් මිදීමේ මාර්ගය යන කරුනු ඔස්සේ කටයුතු කරන්නට අදිටන් කරගන්නේ නම් ඔහුට තමන් මුහුණ දී සිටින අර්බුදයෙන් පහසුවෙන් ගොඩ ආ හැකිය. මෙය වත්මන් භාවිතයේදී ධනාත්මක චින්තනයක් නොවන්නේ ද?

තවත් අතෙකින් ගත් කළ බුදු දහමේ අර්ථවත් ජීවිතයක් ගත කිරීම සඳහා දී ඇති මූලික උපදෙස් මාලාව වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය බෞද්ධ ධනාත්මක දිවි පෙවත සඳහා වූ මා හැඟි උදාහරණ පද්ධතියකි. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා සති, සම්මා සමාධි, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව සහ සම්මා වායාම යන අෂ්ඨ විධ මාර්ගෝපදේශය ධනාත්මක චින්තනයක් නොවන්නේ කෙසේදැයි වල් බූත දොඩවන ඥානසාර බෞද්ධයන්ට පහදා දිය යුතුය.

බුදුන් වදාල සම්මා දිට්ඨිය ඥානසාර ඉල්ලා සිටින මිත්‍යා දිට්ඨියට විරුද්ධය. ඔහු කැම්පේන් කරන මිත්‍යා සංකල්පයන්ට විරුද්ධය. ඔහු තම කතාවෙන් සහ ක්‍රියාවෙන් තමන් පසුපස එන බෞද්ධයන්ගේ සතිය සමාධිය බිඳ හෙලයි. පිසුණාවාචාවෙන්, ඵරුසා වාචාවෙන් ජන මනස බිය වද්දන ඥානසාර ආන්ඩුවේ අනුග්‍රහය ලබමින් මත්පැන් මත්ද්‍රව්‍ය විකුණන, මිනීමරණ, ස්ත්‍රී දූෂණය කරන, රාජ්‍ය ධනය මංකොල්ලා කන ජන පීඩකයන් ආරක්ෂා කරමින් ඔවුන් උත්කර්ෂයට නංවයි. ඒ අතරම ලොව බුද්ධිමත් ජනතාවගේ අනුපමේය ගෞරවාදරයට ලක්ව ඇති බුදු දහමටද නිගා කරයි, අවමන් කරයි.

මළ මී කුණක් දැක් නුවණ ඇත්නම් කෙනෙකුට මෙයින් පවා ප්‍රයෝජනයක් ගත හැකි යැයි දේශනා කළ බව කියන්නේ අපේ බුදු හාමුදුරුවන් ය. ඒ ප්‍රකාශය අසා සිටි මිනිසෙක් මී කුණ විකුණා අවසානයේ මහා ධන සිටුවරයෙකු බවට පත් වූ බව කියැවෙන්නේ බෞද්ධ සාහිත්‍යයේ ය. ඒ එලෙසම සිදුවුනා හෝ නොවුනා හෝ විය හැකි නමුත් ඒ ඉගැන්වීම තුල ඇති පෙළැඹවීමේත් ඉලක්ක කරා හඹා යාමේත්, ව්‍යවසායක වාදයේත්, ගැඹුරු හරය ධනාත්මක චින්තනයක් නොවන්නේ යයි අරිහත් ධජයෙන් විලිවසාගෙන සිටින නූගත් ඥානසාර කියන්නේ කෙසේද?

බටහිර ධනාත්මක චින්තන සංකල්පයේ පවා වලිගයෙන් අල්ලාගෙන සිටින ඥානසාර නොදන්නා වැදගත්ම කරුණ නම් එම සංකල්පය පිලිබඳ වූ ගෝලීය සංවාදයෙහි යෙදී සිටින කිසිදු බුද්ධිමතෙක් බෞද්ධ දර්ශනය ධනාත්මක චින්තනයට පටහැනි වූවක් යැයි කොතැනකදි හෝ ප්‍රකාශ කර නොතිබීම ය.

ලෝකයේ සියළුම ශිෂ්ඨ සම්පන්න සංස්කෘතීන්හි ඒවාට අදාල සාහිත්‍යයක් තිබේ. බෞද්ධ සංස්කෘතියෙහි ඇති සාහිත්‍යයේ ජාතක පොත ඉතා වැදගත් අංගයකි. එහි අඩංගු සෑම කතාවකින්ම අවසානයේ මනුෂ්‍ය ජීවිතයට අර්ථවත් උපදේශයක් දී තිබේ. මුග්ධ ඥානසාර විසිකර දමන්නැයි කියන්නේ ඒ ජාතක පොත ය. ඉන් ඔහු නොකියා කියන්නේ මනුෂ්‍ය ජීවිතයට අවශ්‍ය උසස් සාර ධර්ම පැත්තකට විසිකර දමන ලෙසය.

ඔහු තම දේශනයෙන් උත්කර්ශයට නංවන්නේ අපගේ මව්බිම තිස් අවුරුදු යුද්ධයකට ඇද දැමූ වේලුපිල්ලේ ප්‍රභාකරන් ය. ඒ සමගම ඔහු තම දෘෂ්ඨියෙහි ඇති දිග පළල කොතරම්දැයි විදහා දක්වයි. ඔහුගේ ලෝකයෙහි වීරයා ප්‍රභාකරන් ය. වසර දෙදහස් පන්සියයකට වැඩි ශ්‍රී ලාංකික ඉතිහාසයේ අපට වීරයන් නැතිද? හිංසනය තම ආත්මය කර ගත්, තම ජනතාව මරු කටට යැවූ, ප්‍රජාතන්ත්‍රවිරෝධී ලෙස තමන්ගේම මාරයා සිංහාසනයට කැඳවා ගත් අවසානයේ ඔවුන්ගේ වංචාවට රැවටී කූඨ ප්‍රයෝගකාරී උගුලකට ඇද වැටී බියගුල්ලෙකු සේ යටත් වන්නට පැමිණ ඝාතනය වූ ප්‍රභාකරන් ඥානසාරට වීරයෙකු වූවාට සිහි කල්පනාව ඇති දෙමළ ජනතාවටවත් ඔහු වීරයෙකු නොවේ.

අවසාන වශයෙන් ඥානසාර මේ සේවය කරන්නේ කාටද කුමන අරමුණක් උදෙසාද යනු ණැන ණුවන විහිදුවා විමසා බැලිය යුතු කරුණකි. ඉතා පැහැදිලි ලෙසම ඔහුගේත් ඔහුගේ පිස්සු නඩයේත් අරමුණ බුදු දහමත් බෞද්ධ ශාසනයත් ඇතුලතින්ම කා දමා විනාශ කිරීමය. ඔව්හු දෙවැදෑරුම් ක්‍රියා මාර්ගයක් අනුගමනය කරති. එක් අතෙකින් බුදු දහම අදහන බැතිමතුන්ගේ සිත් දූෂ්‍ය කර ඔවුන් බුදු දහමින් බිඳවා ඈත් කොට තැබීම ය. අනෙක් අතින් ශ්‍රී ලංකාවේ මුල් බැසගෙන ඇති සෙසු ආගම් වලටද ප්‍රහාර එල්ල කොට ඒවා දුර්වල කිරීම ය.

මෙය බටහිර බෞද්ධ විරෝධී කුමන්ත්‍රණයක් යැයි කීමට තරම් අපි ඉක්මන් නොවෙමු. එහෙත් ඔවුන්ගේ මේ දුෂ්ඨ ව්‍යායාමය සාර්ථක වුවහොත් එහි නියත ප්‍රතිඵලය වන්නේ ශ්‍රී ලංකාවේ නන්නත්තාර සමාජයක් බිහිවීම ය. කළකට පෙර මී වැල්ලෑවේ බෝ ගසක බුද්ධ රූප බලන්නට වන්දනාවේ ගිය තවත් විටෙක දොළු කන්දේ වසුරු මිශ්‍ර පිරිත් පැන් සොයා ගිය තවත් වරෙක බුදු පිලිම වල රැස්විහිදෙනු දකිනු රිසි වූ මෝඩ බෞද්ධයන් ඔවුන්ගේ පළමු පහසු ගොදුර බවට අද වන විට පත්ව ඇති බව පෙනේ. මේ පිරිස් හරහා හෙට අනිද්දා වන විට ඥානසාර ලා දන් දීම, පින් දහම් කිරීම, බණ පිරිත් කීම, සිල් රැකීම ආදිය අර්ථ විරහිත නාස්තිකාර ක්‍රියාවන් බවට වූ මතයක් සමාජ ගත කරනු ඇත. සියළු පන්සන් වෙරෙහ විහාරස්ථාන ලාභ ලබන ධනාත්මක ව්‍යවසායන් බවට පත් කරන්නට ඔව්හු යෝජනා කරනු ඇත. ඒ අනුව භික්ෂූන් වහන්සේ ලා රැකියා, ව්‍යාපාර, කර්මාන්ත ආදිය කරමින් හරි හම්බ කරගෙන කෑ යුතු යැය කියනු ඇත. මේ සියල්ලට ඔවුන්ට අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහයත් ආරක්ෂාවත් ආවරණයත් නොඅඩුවම ලැබෙනු ඇත. මක් නිසාද යත් එවැනි තත්ත්වයක් ඔස්සේ බිහිවන ආත්මීය වශයෙන් සදාචාරාත්මක වශයෙන් බුද්ධිමය වශයෙන් පිරිහී ගිය දුර්වල වූ ශ්‍රී ලාංකික ජනසමාජයක් තමන්ට අභිමත පරිදි පාලනය කිරීමට අද ඥානසාරලාට අනුග්‍රහය දක්වන දේශපාලන තක්කඩියන්ට එය මහත් රුකුලක් වන බැවිනි.

***ඥානසාර මේ සේවය කරන්නේ කාටද කුමන අරමුණක් උදෙසාද යනු ණැන ණුවන විහිදුවා විමසා බැලිය යුතු කරුණකි. ඉතා පැහැදිලි ලෙසම ඔහුගේත් ඔහුගේ පිස්සු නඩයේත් අරමුණ බුදු දහමත් බෞද්ධ ශාසනයත් ඇතුලතින්ම කා දමා විනාශ කිරීමය.***



සසුන රකින්නේ දහමට කැප වූ සැබෑ බුද්ධපුත්‍රයන් ය

**අපට අද මේ කරුණු මෙසේ සාකච්ඡා කරන්නට සිදුව ඇත්තේ අන් කිසි හේතුවක් නිසා නොව මේ මිථ්‍යා දෘෂ්ඨික විප්‍රකාර දකිමින් අපගේ ධර්මධර විනයධර මහා නායක ස්වාමීන් වහන්සේලා ගුප්ත ලෙස මුණිවත රැකීම හේතුකොට ගෙනය. ඥානසාරලාට මෙලෙස බුදු දහම සමග සෙල්ලම් කරන්නට නාඩගම් නටන්නට ඉඩ දී සිටියහොත් නිර්මල බුදු දහම විනාශ මුඛයට යන දවස වැඩි ඈතක නොවන බවට කැට තබා අනාවැකියක් කිව හැකිය. මහානායක හිමිවරුන්ගේ බොක්ක රත්වන්නේ එදාට ය.**

ඥානසාරලාගේ මුසා බස් වලට රැවටී වල්මත් වී ඔවුන් පසුපස යන බෞද්ධ තරුණ දූ පුතුන්ගෙන් අපි ඉතා වගකීමෙන් යුතුව එක් ඉල්ලීමක් කරනු කැමැත්තෙමු. ඔබට අවශ්‍ය වන්නේ සැබැවින්ම බෞද්ධ ප්‍රතිපදාවන්හි පිහිටා අර්ථවත් සැපවත් හරවත් ජීවිතයක් ගත කරන්නට නම්, ඔබ සැබැවින්ම බෞද්ධ දර්ශනයේත් බුද්ධ ශාසනයේත් චිරස්ථිතිය ප්‍රාර්ථනා කරන්නවුන් නම්, අප ජන්ම ලාභය ලැබූ මේ පින්බිමෙහි වාසය කරන සෙසු ජාතික*ආගමික ප්‍රජාවන් සමග සහජීවනයෙන් වාසය කිරීමට කැමැත්ත ඇත්තවුන් නම්, මේ දේශයට සැබෑ ලෙස ආදරය කරන්නවුන් නම් ඔබ නොපමාව සිංහල බෞද්ධ සංස්කෘතියත් සැබෑ බෞද්ධ දර්ශනයත් කුමක්දැයි හදාරා අවබෝධ කර ගත යුතුය. ඒ සඳහා කියවා පරිශීලනය කිරීමට

මහාචාර්ය වල්පොල රාහුල
අග්ගමහා පණ්ඩිත බලංගොඩ ආනන්ද මෛත්‍රීය
උඩකැන්දවල සිරි සරණංකර
කළුකොඳයාවේ පඤ්ඤාසේකර
හේන්පිටගෙදර ඤාණසීහ
නාරද
පියදස්සී
කොටපොල අමරකිත්ති
යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම
මඩිහේ පඤ්ඤාසීහ
රේරුකාණේ චන්දවිමල
පැලෑනේ වජිරඥාන
කොටගම වාචිස්සර
වැලිවිට සොරත
කොටහේනේ ප්‍රඥාකිත්ති
කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර
අකුරටියේ අමරවංශ
හෙණ්ඩියගල සීලරතන
මහාචාර්ය හම්මලව සද්ධාතිස්ස

වැනි ගරුතර බහුශ්‍රැත සංඝ පීතෘවරුන් විසින් සිංහල බෞද්ධ සාහිත්‍යයට එක් කරන ලද අගනා මිණි මුතු වන් ග්‍රන්ථ රාශියක් තිබේ. එහෙයින් මේ බොදු බල ත්‍රස්තවාදී මිථ්‍යා ඝනාන්ධකාරයෙන් මිදී සාධාරණ වූත් ධාර්මික වූත් තෘප්තිමත් ජීවතයක් ගත කරනු සඳහා අධිෂ්ඨානශීලීව කටයුතු කරන මෙන් අපි ඉතා ඕනෑ කමින් අපගේ අනාගත පරපුරේ දක්ෂ උගත් දූ පුතුන්ගෙන් ඉල්ලා සිටිමු

සන්නස Cartoon by PK




**සියලුම ජෝතිශ්‍ය කටයුතු**

දෙස් විදෙස් ජේන්ද්‍ර සෑදීම, පලාපල ලියා දීම,
කරදර ගැටළු වලට පිළියම්, අපල වලට පිළියම් හා වාර්තා......
විවාහ සිහුම්, පොරොන්දම් ගැලපීම, දෝෂ විමසීම හා මඟහරවා ගැනීමට උපදෙස්.....
මංගල, මල්වර, නිවාස, විභාග, අකුරු කරවීමේ ශුභ නැකත්.......
නමට අකුරු, නම් තැබීම....
දල, සිරිපති, ත්‍රිෂ්ණමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු.

**ඊ මේල්, දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා......**

රහස්‍යභාවය සුරකිමු

**සුබෝධා ජෝතිශ්‍ය සේවය**

www.wix.com/eppingvic/subodhabeauty
0433536097 subodhaastro@yahoo.com.au